**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2021**

**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් මණ්ඩලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම<br>------------------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 69 වගන්තිය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස හඳුනාගත යුත්තේ වගකීම වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී නිරවුල් කිරීමට අපේක්ෂා කරන වගකීම් සඳහා පමණි. එසේ වුවද ජංගම වගකීම් ලෙස දක්වා ඇති රු.290,919,988ක් වූ වෙළඳ ණය හිමියෝ හා රු.119,436,360ක් වූ වෙනත් ණයහිමි ශේෂය තුල වසර 2ක සිට 5ක් දක්වා කාල පරාසයක් තුල අයවිය යුතු රු.135,406,440ක ශේෂයක් හා වසර 5 ඉක්ම වූ රු.168,912,845ක ශේෂ විය. | පැරණි ශේෂයන් ගෙවීම් සහිතව සැසඳීම නොකර ඉදිරියට ගෙන ඇති බවත්, මෙම තත්වය මේවන විට වෙනස් කර ඇති බැවින් පැරණි ගෙවීම් සහ ආරම්භ ශේෂ සසඳා අයින් කිරීමට බොහෝ කාලයක් ගතවන බැවින් ශේෂයන් එලෙසම ඉදිරියට ගෙන ඒමට සිදුවී ඇති බව | පැරණි ශේෂයන් නිරවුල් කර ප්‍රමිත ප්‍රකාරව ගිණුම්ගත කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් වලින් සියයට 9.8ක් වූ දෙවන ගුණත්වයේ තොග ලෙස අළුත්වැඩියා කලයුතු සහ ක්‍රියාකාරී නොවන තොග වශයෙන් රු.150,731,992ක් වූ අතර එම හේතුවෙන් තොගවල සත්‍ය වශයෙන්ම වටිනාකම් නිරූපණය | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබු විගසින් මෙම ශුද්ධ උපලබ්ධි වටිනාකම් ලෙස ගිණුම් තුළ පෙන්නුම් කිරීමට කටයුතු සලසනු ඇති බව හා මේ වන විටත් කමිටුවක් මගින් මෙම භාණ්ඩ | තොග වල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | නොවන බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 28 වගන්තිය ප්‍රකාරව තොග ආගණනය ශුද්ධ උපලබ්ධි අගයට පෙන්නුම් කර නොතිබීම හේතුවෙන් අවසන් තොගය අධි තක්සේරු වී තිබුණි. | විශ්ලේෂණය කිරීම් කටයුතු සිදුකරමින් පවතින බව | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 34 වගන්තිය ප්‍රකාරව තොග සම්බන්ධ සියළු අලාභයන් ලියාහැරීම හෝ අලාභ සිදු වු කාලපරිච්ඡේදය තුළ වියදමක් සේ හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වුවද, මණ්ඩලයේ හානි තොග ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.3,486,004ක සමුච්චිත හානි තොගය පොත් වලින් ඉවත්කිරීම වෙනුවට හානි වූ තොග වත්කම් ලෙස පොත් වල ඉදිරියට ගෙනඒම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල තොග වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ සිට තොග ඌණතා අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු සලසා ඇති බැවින් , මෙම ඌණතා වියදමක් ලෙස ලියාහැරීමට කටයුතු නොකරන බව. | තොග සම්බන්ධව සියළු අලාභයන් ලියාහැරීම අලාභ සිදු වූ කාලපරිච්ඡේදය තුළ සිදු කල යුතුයි. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොටුව ලක්සල ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා නඩු කටයුත්තක් හේතුවෙන් 2014 වර්ෂයේ දී ඒ සඳහා දරන ලද රු.45,451,390ක මුදල 2021 වර්ෂය දක්වාම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. මෙම වටිනාකම තුල ඇතුලත් වියදම් හා වත්කම් කොටස වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉදිකිරීම සම්පූර්ණයෙන් නවතා දමා ඇති බව හා කොන්ත්‍රාත් ආයතනයෙන් මෙම වටිනාකම් තහවුරු කර ගිණුගත කිරීමට ගෙවූ වියදම් වෙන් කර ගැනීමට නොහැකිවී ඇති බව. | වියදම් හා වත්කම් කොටස වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වෙළඳ හා වෙනත් ණයහිමි ශේෂ තුල රු.74,917,550 ක හර ශේෂ ඇතුලත් වූයෙන් එම වටිනාකමින් ණයහිමි ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂය කාලයක් තිස්සේ පැවත එන බැවින් මේවන විට දෝෂ සහිතව ගිණුම් ගත කර තිබු ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව | ශේෂ නිවැරදිව ගිණුම් ගත කල යුතුයි |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පරිගණක උපාංග ශේෂය තුල ඇතුලත් රු.19,279,453ක් වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර භාවිතයේ පවතින පරිගණක උපාංග නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමට හා භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින පරිගණක උපාංග භෞතිකව හඳුනාගෙන අපහරණය කොට පොත් වලින් කපා හැරීමට පියවර ගෙන නොතිබුණි. | මේ වන විට භාවිතයේ පවතින පරිගණක උපාංග නැවත තක්සේරු කිරීමෙන් ගිණුම් තුළට ගැනීමට කටයුතු කරන අතර අනෙකුත් පරිගණක උපාංග භාවිතයෙන් ඉවත් කර ඇති සියල්ලම කපා හැරීමට කටයුතු කරන බව. | පිළිතුර අනුව ක්‍රියාකල යුතුයි. |
| (ඈ) | 2014 වර්ෂයේ සිට පැවත එන ක්‍රියාකාරි තොග වටිනාකම තුළ අන්තර්ගත වූ මාර්ගස්ථ තොග ගිණුමේ වටිනාකම රු.6,291,571ක් වූ අතර එහි පවත්නා ශේෂ කාලීනව සසඳා නිවැරදි තොග වටිනාකම නිරවුල් නොකිරීම හේතුවෙන් සත්‍ය වශයෙන් නොපවතින තොග වටිනාකමක් ගිණුම් වල දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී මෙම විෂමතාවය නිරවුල් කිරීමට කටයුතු කරන බව. | තොග ශේෂය කාලීනව සසඳා නිරවුල් කල යුතුයි |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ)දේපල පිරියත හා උපකරණ | 227,931,158 | 95,541,889 | 132,389,269 | මෙම ශේෂයන් පැරණි ඉදිරියට ගෙන එන ශේෂ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ලියා හැරීමට කටයුතු සලසන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකල යුතුයි. |
| (ආ) ක්‍රියාකාරී තොග | 390,694,027 | 389,284,437 | 1,409,590 | 2022 වර්ෂයේදී මෙම විෂමතාවය සොයා බලා ශේෂ නිරවුල් කිරීමට කටයුතු සලසන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකල යුතුයි |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| --------- | -------- | ------------ | -------------------------------------- | ------------ |
| | රු. | | | |
| (අ) ප්‍රාග්ධන ප්‍රදාන | 107,951,172 | ශේෂසනාථ | වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එන ශේෂය නිවරදා කිරීමට කටයුතු කරන බව. | විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |
| (ආ)ණයගැතියන් | 19,429,671 | ශේෂසනාථ | මෙය ඉතා පැරණි ශේෂ වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ලියා හැරීමට කටයුතු කරන බව | -එම- |
| (ඇ)රැඳවුම් මුදල් | 12,002,564 | ශේෂසනාථ | මෙය ඉතා පැරණි ශේෂ වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ලියා හැරීමට කටයුතු කරන බව | විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය |
| (ඈ)උපචිත වියදම් | 6,546,541 | ශේෂසනාථ | මෙය ඉතා පැරණි ශේෂ වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ලියා හැරීමට කටයුතු කරන බව | -එම- |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------- | -------------- |
| අලෙවිය ප්‍රවර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් මණ්ඩලය සතු ගොඩනැගිලි වල ව්‍යාපාර කටයුතු කිරීම සඳහා බාහිර ආයතන 7ක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර ආයතන 02 පමණක් ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාර ලැබිය යුතු බදුකුලී හා ලාභ ප්‍රතිශත මණ්ඩලයට අහිමි වී තිබුණි. ඊට අමතරව ව්‍යාපාරික ආයතන 08ක් සඳහා තුම්මුල්ල ලක්සල ගොඩනැගිල්ලේ පළමු මහලේ ඉඩකඩ කුලියට දීම වෙනුවෙන් 2018, 2019 සහ 2020 වර්ෂ වලට අදාලව අයවිය යුතු රු.4,869,200ක කුලී මුදල් අයකර | ගිවිසුම්ගත පරිදි අනෙකුත් ආයතන මේ වන විටත් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැති බැවින් 2022 නොවැම්බර් 30 දිනට පෙර එම ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලෙසට අවසානාත්මක නිවේදනයක් එම ආයතන වෙත දන්වා ඇති බව හා 2022 දෙසැම්බර් 15 දිනට පෙර එම හිඟ මුදල් ගෙවීමට තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයට යාබදව ආයතනය අපොහොසත් වුවහොත් ආයතනයෙන් ඉවත් වීමට සිදුවන බව ලිඛිතව දැනුම් දී ඇති බව. | ලැබිය යුතු කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

ගැනීමට කටයුතු කර නොතිබුණි. තුම්මුල්ල ප්‍රදර්ශනාගාරයට යාබදව පිහිටි ගොඩනැගිල්ල පුද්ගලික ආයතනයක් වෙත ව්‍යාපාර කටයුතු සඳහා ලබා දී තිබූ අතර 2019 වර්ෂයේ සිට ලැබිය යුතු රු.7,643,754 ක කුලී ආදායම අයකර ගැනීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------ | ----------- |
| (අ) | හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කොටුව ලක්සල ගොඩනැගිල්ල උකසට තබා 2012 – 2018 කාලය තුලදී ලංකා බැංකුවෙන් ලබාගත් රුපියල් මිලියන 950ක ණය මුදලෙන් 2019 වර්ෂය අවසානය වන විට ශේෂව පැවති මිලියන 273ක ශේෂය, 2020 වර්ෂයේ නව ණය මුදල් 3ක් ලෙස ප්‍රතිලේඛණගත කර තිබුණු අතර, ඊට ගෙවිය යුතුව තිබූ ණය වාරික සහ පොලී නොගෙවීම හේතුවෙන් ණය මුදල හා පොලීයද සමග 2021 වර්ෂයේ සිට නව ණය මුදල් 9 ක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි. මේ හේතුවෙන් 2021 වර්ෂය අවසාන වන විට මුළු ණය ප්‍රමාණය රු.306,276,632ක් දක්වා සියයට 12 කින් වර්ධනය වී තිබුණි. මෙම ණය මුදල් සඳහා 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු රු.9,875,272 ක් වූ ගෙවිය යුතු ණය පොලී මුදල් මේ දක්වාම ගෙවා නොතිබුණි | 2020/21 වර්ෂ තුළදී කොවිඩ් වසංග තත්වය හමුවේ රටෙහි ආර්ථික පසුබැම හේතුකොට ගෙන ආයතනයේ අලෙවි ආදායම සම්පූර්ණයෙන්ම කඩා වැටීම හේතුවෙන් බැංකු ණය ගෙවීමට නොහැකි වූ බව හා 2022 දෙසැම්බර් මස 31 දින දක්වා ණය සහන ආයතනය වෙත නිර්දේශ වී ඇති බව. | නිශ්චිත කාලපරිච්ඡේදයට අදාල පොලී හා වාරික ගෙවීම් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා මහ බැංකුවේ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සපයන ලද ප්‍රතිමූල්‍යා පහසුකම හරහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත 2013 වර්ෂයේ දී රුපියල් මිලියන 200 ක ණය මුදලක් වාරික 2ක් යටතේ ප්‍රදානය කර තිබුණි. මෙම ණය මුදල 2020 දෙසැම්බර් 31 දින වන විට එය රු.158,399,824 දක්වා අඩු වී තිබුණි. නමුත් 2020 වර්ෂයේ පොලී නොගෙවීම මත පොලී මුදල රු.8,323,585ක් හා 2021 මාර්තු මාසය දක්වා පොලී මුදල රු.4,586,188ක් වශයෙන් රු.12,909,773ක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන විට මුළු ණය මුදල රු.171,309,597ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේම 2021 වර්ෂය සඳහා ණය වාරික හා පොලී මුදල් වශයෙන් රු.21,796,529ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2020/21 වර්ෂ තුළදී කොවිඩ් වසංග තත්වය හමුවේ රටෙහි ආර්ථික පසුබෑම හේතුකොට ගෙන ආයතනයේ අලෙවි ආදායම සම්පූර්ණයෙන්ම කඩා වැටීම හේතුවෙන් බැංකු ණය ගෙවීමට නොහැකි වූ බව | නිශ්චිත කාලවකවනු තුල පොලී හා වාරික ගෙවීම් තුලින් අවාසි අවම වන ලෙස කටයුතු කල යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 වගන්තියෙන් සංශෝධිත<br>I. මුදල් රෙගුලාසි 371 (5) | කාර්යය නිමකර දින 10ක් තුළ අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, මණ්ඩලයේ සේවකයින් ලබාගෙන තිබූ වසර 2ට අඩු රු.708,818ක විවිධ අත්තිකාරම් මුදල් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාලව | 2011 සහ 2018 වර්ෂ වලට අදාළ අත්තිකාරම් ශේෂ තවදුරටත් පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට ඉදිරියේදී 2022 වර්ෂය තුළ උපරිමයෙන්ම කටයුතු සලසන බව. | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් නිරවුල් කල යුතුයි |

| | | | | |
|---|---|---|---|---|
| | | මණ්ඩලයේ විවිධ අංශ හා නිලධාරීන්/සේවකයින් වෙත නිකුත් කළ රු.17,589,311ක වෙළඳ/වෙළඳ නොවන ගැනුම් අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | |
| II. | මුදල් රෙගුලාසි 371 (2) (අ) | එදිනෙදා සුළු වියදම් දැරීම සඳහා මාණ්ඩලික නිලධාරියකුගේ සෘජු අධීක්ෂණය යටතේ සුළු වියදම් සඳහා රු.25,000ක උපරිමයක් දක්වා සුළු මුදල් අතුරු අග්‍රිමයක් නිකුත් කලහැකි වුවද ප්‍රදර්ශනාගාර 9 කට හා ප්‍රධාන කාර්යාලයේ අංශ 2 කට එම සීමාව ඉක්මවා සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි. | සියළුම සුළු වියදම් රු.25,000 සීමාව පවත්වා ගැනීමට 2023 ජනවාරි මස සිට කටයුතු කරන අතර සියළුම අංශ ප්‍රධානීන්ට මේ පිළිබඳව දැනුවත් කරන බව. | චක්‍රලේඛ වලට අනුගතව ක්‍රියාකල යුතුයි |
| (ආ) | ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 23 ඡේදය | මණ්ඩලයේ සිදු වී ඇති දූෂණ සම්බන්ධයෙන් පවත්වා ඇති මූලික විමර්ශන වලදී අනාවරණය වී ඇති කරුණු අනුව නිලධාරිනියන් දෙදෙනකු විසින් සිදුකර ඇති විෂමාචාර හේතුවෙන් 2015 නොවැම්බර් 24 දින සිට රාජකාරි වැඩ තාවකාලිකව නතර කර තිබුණි. 2015 දෙසැම්බර් 23 දින මෙම නිලධාරීන් වෙත චෝදනා පත්‍ර නිකුත් කර නැවත 2016 ජනවාරි 11, 2016 ජූනි 21 හා 2016 ජූනි | මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ සම්බන්ධයෙන් සලකා බලා විනය නියෝග සම්බන්ධයෙන් අවසාන තීරණය ලබා දීමට නියමිත බව. | නොපමාව විනය නියෝග ක්‍රියාත්මක කල යුතුයි |

| | | | | |
|---|---|---|---|---|
| | | 06 සංශෝධිත චෝදනා පත්‍ර නිකුත් කර තිබුණි. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණ 2020 පෙබරවාරි හා 2019 දෙසැම්බර් මාස වලදී අවසන් කර ඇතත් විනය නියෝග 2022 ඔක්තෝබර් දක්වා නිකුත් කර නොතිබුණි. | | |
| (ඇ) | 2003 ඔක්තෝබර් 28 දිනැති PED 17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2021 ඔක්තෝබර් මස සිට 2022 මාර්තු 31 දක්වා පවත්වන ලද ඩුබායි එක්ස්පෝ 2021/2022 ජාත්‍යන්තර අලෙවි ප්‍රදර්ශනය සඳහා ලක්සල නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් විදේශ සංචාරය සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර, නිලධාරීන් විසින් රු.1,219,480ක විදේශ ගමන් දීමනා හා ඒ ආශ්‍රිත වියදම් ලබාගෙන තිබුණි. | රාජකාරි නිවාඩු අයදුම්පත් 2021 සැප්තැම්බර් 21 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශය වෙත නිවාඩු අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත සිහිකැඳවීමක්ද සිදුකර ඇතත් අනුමැතිය මෙතෙක් මණ්ඩලය වෙත ලැබී නොමැති බව. | විදේශ සංචාරයට පෙර නිවාඩු අනුමත කලයුතුයි |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 කොටසේ 9 වගන්තියෙන් සංශෝධිත මු.රෙ 880 විධිවිධානයන්ට අනුව ඇප තැබිය යුතු සියලුම රාජ්‍ය නිලධාරීන් එම මුදල් රෙගුලාසි අනුගමනය කරමින් ඇප තැබීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කළ | ඇප තැබීම සඳහා නැවත ආයතනයේ සේවකයින්ගේ ආදාළ කාර්ය විශ්ලේෂණය කිරීමෙන් සේවකයින්ගේ ඇප තැබිය යුතු සේවකයින් වෙතින් ඇප මුදල් තබා ගැනීමට කළමනාකරණය වෙත නිර්දේශ ඉදිරිපත් කරන | ආයතනයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු නොවන පරිදි චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි |

| | | |
|---|---|---|
| යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඇප තබන ලද නිලධාරීන්ගෙන් අයකරන ලද සේවක ඇප මුදල් අදාල නිලධාරියා නමින් ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් නොකොට ඊට පටහැනිව රු.2,410,000 ක මුදලක් මණ්ඩලයේ ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි. එම මුදලට පොලී මුදලක් මණ්ඩලය වෙත ලැබී නොතිබුණු නමුත් අදාල නිලධාරියා වෙත ගෙවිය යුතු පොලී මුදල් මණ්ඩලය විසින් ගණනය කර ගෙවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.1,289,567ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | අතර මේවන විට ඇප තබා ඇති මුදල් තනි ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කර පොලිය ලබා ගැනීමටද කටයුතු 2022 වර්ෂය තුළ සිදුකිරීමට බලාපොරොත්තු වන බව. | |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.58,546,847 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 105,744,071 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,197,224 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු. 61,438,748 ක් හා වෙනත් ආදායම් රු. 22,573,938 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2021 සිට 2023 කාලපරිච්ඡේදයට අදාලව සකසා තිබූ ව්‍යාපාර සැලැස්මට අනුව 2021 වසරට අදාලව රු. මිලියන 435ක ඉලක්කගත විකුණුම් ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණ ද, 2021 වසර තුල මණ්ඩලය මඟින් උපයා තිබූ තත්‍ය ආදායම රු.මිලියන 137ක් වූයෙන් ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 31 ක ආදායමක් පමණක් උපයා තිබුණි. අලෙවි ආදායම ඉහළ නැංවීමේ අරමුණින් 2021 වර්ෂය තුල මණ්ඩලය විසින් වරලත් විදේශීය අලෙවි නියෝජිත ගිවිසුම් හතකට එළඹ තිබුණද, එම ගිවිසුම් ප්‍රකාරව ඇමරිකා එක්සත් | මෙම තත්වය වූයේ රටෙහි පැවති අර්බුධකාරී වාතාවරණය මත විදේශීය සංචාරකයින්ගේ නොපැමිණීම මත වන බවත්, ආයතනයෙහි ආදායම වැඩිකිරීම උදෙසා විදේශීය වරලත් අලෙවි නියෝජිතයින් මඟින් අලෙවිසැල් විවෘත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරිත්වය තීරණය කරඇති බව හා මෙම තීරණය අනුව ඇමෙරිකා එක්සත් ජනපදයේ අලෙවි ආදායම රු.මි.15ක් වූයේ මෙය පළමු විදේශ අලෙවි නියෝජිත ගිවිසුමවූ බැවින් ලාභ අන්තරය ඉතා පහළ මට්ටමක හෙවත් | නව මිල කිරීමේ උපායමාර්ගයන් අනුගමනය කොට විදේශීයව මෙන්ම දේශීයවද අලෙවිය ඉහළ නැංවීමට කළමනාකරණය කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ජනපදයේ පමණක් අලෙවිසැලක් විවෘත කර තිබූ අතර, 2021 අගෝස්තු 06 දින වරලත් අලෙවි නියෝජිත වෙත පිරිවැය රු 15,483,376 ක් වූ භාණ්ඩ යවා තිබුණි. අලෙවි නියෝජිත සමඟ ඇති කරගත් ගිවිසුමේ 05.4.1 වගන්තිය ප්‍රකාරව ආදායම් කොටස බෙදාගැනීම, පළමු වසර තුන තුළ මාසයක් තුල උපයන විකුණුම් ආදායම එක්සත් ජනපද ඩොලර් 50,000 හෝ ඊට වැඩි නම් මාසයකට සියයට තුනක ආදායම් ප්‍රතිශතයක් මණ්ඩලයට ලබාදිය යුතු බවට එකඟ වී තිබුණද මෙම වාර්තාවේ දින විටත් එම මුදල ලැබී නොතිබූ අතර ලද භාණ්ඩ වල විකුණුම් මිල වූ රු.19,889,698ක මුදලට ලබාදී තිබූ බැංකු සුරක්ෂණය මුදල් කර විකුණුම් මිල පමණක් පියවාගෙන තිබුණි. මණ්ඩලයේ දේශීය විකුණුම් වලට අදාලව උපයන ලාභ ආන්තිකය සියයට 50 සිට සියයට 73 දක්වා පරාසයක තිබුණද, විදේශ වරලත් අලෙවිසැල් (ෆැන්චයිස්) විකුණුම් මඟින් උපයා තිබූ ලාභ ආන්තිකය සියයට 22 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි. | සියයට 22 ක් බව තහවුරු කළ හැකි බව .එසේ නමුදු ඉදිරියේදී යවන්නාවූ සියළුම අලෙවි නියෝජිත ඇණවුම් සඳහා ලාභ ආන්තිකය සියයට 40 ක පමණ තබා ගැනීමට ක්‍රියා මාර්ග ගන්නා බව. | |
| (ආ) | 2020 ක්‍රියාකාරි සැලැස්ම තුළ කල් ඉකුත් වීමට ආසන්න සහ සෙමෙන් චලනය වන තොග කල්තියා හඳුනාගෙන විශේෂ වට්ටම් ලබා දෙමින් ඒවා මුදල් බවට පත්කිරීමට යෝජනා වී තිබුණි. එසේ වුවද, රු.9,455,546ක් වටිනා මැණික් හා ස්වර්ණාභරණ තොග 2011 වසරේ සිට විකිනීමකින් තොරව නෂ්ට වෙමින් පවතින අතර, මෙම තොග සඳහා රු.8,102,312 ක් එකී කාලපරිච්ඡේද වලදී සැපයුම්කරුවන්ට ගෙවීම්ද කර තිබුණි. | සැපයුම්කරුවන්ට ගෙවීමෙන් මෙම තොගය ආයතනය සතු කරගෙන ඇති අතර මෙම තොගය නැවත අළුත්වැඩියා කිරීමෙන් විශේෂ වට්ටමේ ලබාදීමෙන් මුදල් බවට පත්කර ගත හැකි අතර අනෙක් අයිතම ප්‍රදර්ශනාගාර තුළට දැම්මෙන් විකුණුම් ආදායමක්ද ලබාගත හැකි බැවින් මෙම තොගය සම්බන්ධව වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සලසන බව. | අළුත්වැඩියා කොට විශේෂ වට්ටම් ලබාදෙමින් අලෙවි කිරීමට නොපමාව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මණ්ඩලයේ ආදායම ඉහළ නංවා ගැනීමේ අරමුණින් 2021 වර්ෂයේ සිට මාර්ගගත විකුණුම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර තිබූ අතර, 2021 වසර තුල එමඟින් රු.769,513 ක ආදායමක් පමණක් උපයා තිබුණද දැනට එම ක්‍රමවේදය ක්‍රියා විරහිතව පවතී. වර්තමානය වන විට මාර්ගගත මිලදී ගැනීම සඳහා ජනතාවගේ වැඩි නැඹුරුවීමක් ඇති තත්වයක මණ්ඩලය විසින් පුළුල් ප්‍රචාරණයක් තුලින් අලෙවි අවස්ථා ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2022 වර්ෂයේ සැප්තැම්බර් දක්වා රු.37,856ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | 2021 වර්ෂයේදී මාර්ගස්ත විකුණුම් ක්‍රමවේදය කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු වුවද, වෙබ් අඩවියෙහි නඩත්තු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් නොමැති තත්වයක් හමුවේ මෙම ක්‍රියාවලිය තාවකාලිකව ඇණහිටීමක් සිදුවූ බව හා එසේ වුවත් Web platform එකක මාර්ගයෙන් විකුණුම් ක්‍රමවේදය කිරීමෙන් අලෙවි අදායම වැඩිකර ගැනීමට ඉදිරියේදී කටයුතු සලසන බව. | පිළිතුර අනුව ක්‍රියාකල යුතුයි. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | -------------------- | ---------- |
| අමාත්‍ය මණ්ඩල තීරණ අංක 12/1523/553/020 හා 2012 ඔක්තෝබර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මඟින් ගාල්ල උණවටුන සීමා සහිත ලංකා සළුසල ශාඛාව පිහිටි දේපල ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නීත්‍යානුකූල අයිතිය පැවරීමට අනුමැතිය ලැබී තිබූ අතර ඒ අනුව 2012 දෙසැම්බර් 12 දින දේපල මිලදී ගැනීම සඳහා රු. 15,248,576ක් සළුසල ආයතනයට ගෙවා තිබුණි. මෙම දේපල සම්බන්ධයෙන් සළුසල ආයතනයට එරෙහිව වෙනත් පාර්ශවයක් විසින් කොළඹ දිසා අධිකරණයේ අංක DMR 4421/10 යටතේ නඩුවක් ගොනුකර ඇති අතර තවදුරටත් නීතිමය කටයුතු අවසන් කර නොමැති හෙයින් දේපල මිලදී ගැනීම සඳහා මුදල් ගෙවා වසර 10ක් ඉක්මගොස් ඇතත් එම දේපලෙහි නීත්‍යානුකූල අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | මුදල් ගෙවා තිබියදීත් මෙම දේපළ පවරා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මේ පිළිබඳ කඩිනම් අවධානය යොමු කොට ඉහත දේපළ නීත්‍යාණුකූලව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත නොපමාව පවරා දීමට කටයුතු කරන මෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමාට දැනුම් දී ඇති බව | නොපමාව නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කලයුතුයි |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1990 වර්ෂයේ පිහිටුවන ලද ශිල්පීන්ගේ සුභසාධන සංවර්ධන අරමුදලේ ව්‍යවස්ථා රෙගුලාසි ප්‍රකාරව ශිල්පීය සුභසාධනය වෙනුවෙන් Benevolent Fund නමින් පවත්වාගෙන ගිය අරමුදලේ 2021 දෙසැම්බර් 31 දක්වා රු.5,023,891 මුදලක් එකතු වී ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම අරමුදල ශිල්ප සභාව වෙත පැවරීමට 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද මේ දක්වා එම පැවරීම නොකොට රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක නිශ්කාර්යව පැවතුණි. | 2022 වර්ෂයේදී ස්ථාවර තැම්පතුවක් පිහිටුවා ශිල්පීය යහසාධක ක්‍රියාවලිය නැවත සක්‍රීය කිරීමට බලාපොරොත්තු වන බව. | මෙම අරමුදල ශිල්ප සභාව වෙත පැවරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | මහජන බැංකුවේ නුවරඑළිය ශාඛාවේ පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුමේ 2013 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.85,587ක් වූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.4,785,163ක් විය. මෙසේ ජංගම ගිණුමක් තුල මුදල් තැන්පත් කිරීම තුල ආර්ථික වාසියක් නොලැබෙන අතර උග්‍ර අරමුදල් අර්බුදයකට පත්ව ඇති මණ්ඩලය මෙම මුදල් ඵලදායී ආයෝජනයක් සඳහා හෝ එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නුවරඑළිය ජංගම ගිණුමෙහි මේ වන විට ඇති මුදල් ඵලදායි ලෙස ආයතනයේ මුදල් අවශ්‍යතාවයන් සඳහා භාවිතයට ගැනීමට කටයුතු සලසන බව. | එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් කරනු ලබන බාහිර කොන්ත්‍රාත් වැඩ සඳහා ඉදිරිපත් කළ යුතු ඇප තැන්පතු සඳහා මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් වර්ෂ 10කට වැඩි කාලයක සිට පවත්වා ගෙන ගොස් තිබූ අතර, 2021 | හදිසි අවශ්‍යතාවන් සඳහා උපයෝගී කර ගැනීම සඳහා ගිණුමේ ශේෂය ආපසු ගැනීමට උත්සාහ නොකල බව | එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුයි. |

දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,249,872ක් විය. එම ගිණුම සඳහා සියයට 3ක් වැනි සුළු පොලී ප්‍රතිශතයක් ලැබී තිබූ අතර 2021 වර්ෂයේ පොලී මුදල් වශයෙන් රු.66,412ක් බැංකුව විසින් ඉතිරි කිරීමේ ශේෂයට එකතු කර තිබුණි. මණ්ඩලය විසින් බාහිර වැඩක් හෝ කොන්ත්‍රාත්තුවක් සිදුකරන අවස්ථාවේ දී අවශ්‍ය වන ඇප මුදල් අවස්ථානුකූලව තැන්පත් නොකර මෙලෙස විශාල මුදලක් ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා තිබීම තුලින් විශාල පොලී ආදායමක් අහිමිවී තිබුණි.

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපාරික වශයෙන් කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ඉහළ වාණිජ වටිනාකමකින් යුතු වර්ග අඩි 44,000ක් වූ කොළඹ කොටුව ලක්සල සිව්මහල් ගොඩනැගිල්ල 2013 වර්ෂයේ දී නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ICTAD ආයතනයේ ලියාපදිංචිය නොමැති කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණද, 2014 වර්ෂයේ දී නවීකරණ කටයුතු අතරමග නවතා දමා තිබුණි. ICTAD ආයතනයේ වාර්තාවට අනුව කොන්ත්‍රාත්කරුවෙත ගෙවා ඇති මුදලින් සිදුකර ඇති භෞතික වැඩ වටිනාකම අඩුකළ පසු තවදුරටත් කොන්ත්‍රාත්කරු භාරයේ පවතින හස්ත කර්මාන්ත මණ්ඩලයට අයවිය යුතු රුපියල් මිලියන 30ක මුදල අයකර ගැනීමටගෙන ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි.මීන් වර්ග අඩි 1200ක භූමි ප්‍රමාණයක පමණක් කොටුව ලක්සල ප්‍රදර්ශනාගාරය | ලක්සල ගොඩනැගිල්ල නවීකරණ කටයුතු 2014 වර්ෂයේදී අතරමඟ නවතා ඇත. මීට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද මේ වනවිට පරීක්ෂණයක් සිදුකරමින් පවතින අතර එහි පරීක්ෂණ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති බව හා මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරු අත පවතින රු.මි.30ක මුදල මණ්ඩලයට අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය නීතිමය කටයුතු ආරම්භකර ඇති බව, ගොඩනැගිල්ලේ නවීකරණය සඳහා වැයවෙතැයි අපේක්ෂිත රු.මි.200ක මුදල මෙම මණ්ඩලයට සපයා ගැනීමට අපහසු හෙයින් සුදුසු ව්‍යාපාරික යෝජනා (EOI’s) කැඳවා ගොඩනැගිල්ල නවීකරණය කොට භාවිතා කිරීමට අයෝජනයක් කල හැකි ආයෝජකයෙකු තෝරා ගැනීමට මේ වන විට සිදු කරමින් පවතින බව. | මණ්ඩලය සතු වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කල යුතුයි |

පවත්වාගෙන යනු ලබන අතර වර්ෂ කීපයක සිට මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට නොහැකිව නිෂ්කාර්යව පැවතුනි. මණ්ඩලය සතු පර්චස් 60ක් පමණ වූ මෙම කොළඹ කොටුව ඉඩම හා පර්චස් 22ක් පමණ වූ ගාල්ල ඉඩම පවතින ආර්ථික වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 මාර්තු 28 හා 2018 සැප්තැම්බර් 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS 1702 හා DMS 1702/V01 – III ලිපි මඟින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරගෙන තිබුණ ද ඊට අනුකූලව කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කිරීම ක්‍රියාත්මක කර නොතිබුණි. 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව නව වැටුප් ක්‍රමය අනුව වැටුප පරිවර්තනය කිරීමට පෙර අදාල සියළු තනතුරු ඒ ඒ සේවා ගණනයන්ට හා වැටුප් පරිමාණයන්ට ඇතුලත් වන සේ ගලපා සකසනු ලබන යෝජනා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට අනුකූලතා සහතිකයක් ලබාගෙන නොතිබූ අතර, ඒ හේතුවෙන් අන්තර්ග්‍රහණයෙන් පසුව වැඩිවිය හැකි වැටුප් ප්‍රමාණයන් පිළිබඳව නොදැන, අන්තර්ග්‍රහණය කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ හේතුවෙන් අනුමත කාර්යමණ්ඩලය තුල ඇතුලත් ඉහළ වැටුප් පරිමාණයන් සහිත තනතුරු වල පුරප්පාඩු තිබියදී සේවකයින් බහුතරයක් | ආයතනයේ මූල්‍ය තත්ත්වය යහපත් වන තුරු ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදි. එහෙත් දීර්ඝ කාලීනව උසස්වීම් නොලද උසස්වීම් අපේක්ෂා කරන ස්ථිර කාර්ය මණ්ඩලය හා ස්ථිර සේවයට අන්තර් ග්‍රහණය වීමට වසර 05කට වඩා වැඩි කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කරන ලද ඉල්ලීම් සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් තීරණය අනුව රේඛීය අමාත්‍යාංශ නියෝජිතයකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනකු නියුතු කමිටුවක් මෙම කාර්ය මණ්ඩලයේ මෙම ඉල්ලීම් හා දුක් ගැනවිලි අධ්‍යයනය කර නිර්දේශ වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව. | කාර්ය මණ්ඩලය අනුමත තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරිමට කටයුතු කල යුතුයි. |

පහළ වැටුප් පරිමාණයන් වල පිහිටුවා තිබීමෙන් උසස් වීම් ද කළමනාකරණය විසින් අහිමි කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06ක් ප්‍රමාද වී 2022 සැප්තැම්බර් 22 දින ඉදිරිපත් කර තිබුණ ද කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් වසර 02 තුළ පැවති රටේ අර්බුධකාරී තත්වය සහ සංචරන සීමා මත වාර්ෂික ගිණුම් ප්‍රමාද විය. 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා අදාළ කාල සීමාව තුළ නොපමාව එවීමට කටයුතු සලසන බව. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනයේදී විගණනයට ඉදිරිපත් කල යුතුයි. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත අගයන් සහ සත්‍ය වියදම් අතර විචලනය සියයට 11ක සිට සියයට 244 ක් දක්වා පරාසයක පැවතුණි. තවද, වියදම් අයිතම 04 ක් සඳහා ඇස්තමේන්තු සකස් නොකර රු3,035,952 ක වියදමක් දරා තිබුණු අතර, වියදම් අයිතම 02 ක් සඳහා රු19,300,000 ක ඇස්තමේන්තු කර තිබුණ ද වියදමක් දරා නොතිබුණි | පිළිතුරු ලබාදී නොමැත | අයවැය ලේඛණය පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුයි. |